# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## LOW FRICTION COMPOSITE BRAKE BLOCKS 20,000 ක් ප්‍රසම්පාදනය

ශ්‍රී ලංකාව, කොළඹ - තැ.පෙ. 355, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත LOW FRICTION COMPOSITE BRAKE BLOCKS 20,000 ක් සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු භාරගනු ලැබේ. ලංසුකරුවන්ට, ඇටෝර්නි බලපත්‍රයකින් ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයකු මගින් ලංසු ඉදිරිපත් කළ හැකිය.

2. ලංසුකරණය ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය මගින් මෙහෙයවනු ලැබේ.

3. අභිලාෂී, යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට පහත සඳහන් ලිපිනයෙන් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

    නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),<br>
    දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,<br>
    ඕල්කොට් මාවත,<br>
    කොළඹ - 10, ශ්‍රී ලංකාව.

| | |
|---|---|
| දුරකථන අංක | : 94(11)2438078 හෝ 94(11)2436818 |
| ෆැක්ස් අංක | : 94(11)2432044 |
| විද්‍යුත් තැපැල | : srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : www.railway.gov.lk |

4. අයිතමයේ නිෂ්පාදකට වැකුම් බ්‍රේක් මගින් ක්‍රියාත්මක වන දුම්රිය මැදිරිවල භාවිතය සඳහා LOW FRICTION COMPOSITE BRAKE BLOCKS නිෂ්පාදනය කිරීමේ හා සැපයීමේ වසර 5 ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.

5. අයිතමයේ නිෂ්පාදක පසුගිය වසර තුන (03) තුළ අඩුතරමින් තොග ඇණවුම් තුනක් (03) සම්පූර්ණ කර තිබිය යුතුය. ඉන් එකක් නිෂ්පාදනය කළ රටෙන් පිට රටක විය යුතුය.

6. අ. ඕනෑම ලංසුකරුවකු සඳහා හෝ වෙනුවෙන් ඒජන්තවරයකු හෝ උප ඒජන්තවරයකු, නියෝජිතයකු හෝ නම් කරන ලද අයකු ලෙස ක්‍රියාකරන පුද්ගලයින් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් පරිදි ශ්‍රී ලංකාවේ පොදු සමාගම් රෙජිස්ට්‍රාර් වරයා සමග ලංසු ඉදිරිපත් කිරීමට පෙර ලියාපදිංචි වී සිටිය යුතුය. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. එම මුල් පිටපත් ඉදිරිපත් නොකරන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

    ආ. එසේම, ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කළ වහාම සහ ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට පෙරාතුව 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් පරිදි ලියාපදිංචි විය යුතුය. එලෙස පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් පරිදි නිකුත් කළ ලියාපදිංචි සහතිකය අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන තුරු ප්‍රසම්පාදනය පිරිනමනු නොලැබේ.

7. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) ලිපිනයට හෝ විදේශයන් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රු. 14,000/- ක් හෝ පහසුවෙන් මාරුකරගත හැක. මුදල් වර්ගයකින් සමාන වටිනාකමැති ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, අභිලාෂී ලංසුකරුවන්හට 2023-05-15 දින සිට 2023-07-10 දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.

8. ලංසු 2023-07-11 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය.

    සභාපති,<br>
    දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,<br>
    ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
    දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,<br>
    ඕල්කොට් මාවත, කොළඹ - 10, ශ්‍රී ලංකාව.

ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ශ්‍රී ලංකාව කොළඹ - 10, ඕල්කොට් මාවත, තැ.පෙ. 1347, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, 3 වන මහලේ. කාමර අංක 01 හිදී 2023-07-11 දින ප.ව. 2.00 ට ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**<br>
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (ප්‍රධාන) කමිටුව,**<br>
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංකය : SRS/F.7891**